# ලංකාවිත්ති
# LANKA VITHTHI

මවත්
මව්බිමත්
ස්වර්ගයට
වඩා උතුම්ය!
Mother and
Motherland
are nobler
than Heaven



FOR FREE
CIRCULATION

නොමිලේ
බෙදාහැරීම
පිණිසයි

VOLUME 12
NUMBER 09

ලොව කොතැනවුව වෙසෙන සිංහලයින් සඳහා ලන්ඩනයේ මුද්‍රිත සිංහල පුවත් පත
SINHALA LANGUAGE NEWSPAPER PUBLISHED IN LONDON FOR THE SINHALA READERS WHEREVER THEY ARE.

JANUARY 10, 2010 ජනවාරි මාසය (බුද්ධ වර්ෂ 2553 දුරුතු මාසය) http://www.lankaheritage.com/lankaviththi/


# මෙම දුෂ්ට කුමන්ත්‍රණය පරදවමු!

♦ සංජය විමලරත්න ශ්‍රීලංකාවේ සිට

**ප**සුගිය අප දෙසැම්බර් කලාපයේ අප මාතෘ භූමියට එරෙහිව දේශීය හා ජාත්‍යන්තර සතුරු කණ්ඩායම් සැළසුම් කර ඇති කුමන්ත්‍රණකාරී වැඩපිළිවෙල කුමක්ද යන්න එළිදරව් කළෙමු. මෙම සතුරු හොර මුළ ඇමරිකාව, බ්‍රිතාන්‍යය, නෝර්වේ සහ විදේශගත දෙමළ ඩයස්පෝරාව ආදී කොටස්වලින් සැදුම් ලත් අතර, එහි මැනේජර් වැඩය පවරා ඇත්තේ ලංකාව තුළ දැන් ඒකරාශීව සිටින සිටින බටහිර ගැති, බංකොලොත්, දේශද්‍රෝහීන් පිරිසකට ය. මුන් සියල්ලෝ දෙමළ කොටි ත්‍රස්තවාදය විනාශ කිරීම ගැන ශ්‍රීලංකා සන්නද්ධ හමුදාවන් සහ පවතින රජය කෙරෙහි අතිශය තරහෙන් සිටින පිරිසක් වෙති.

ඒ අප ලියූ සටහනේම ළඟදී ඇතිවිය හැකි කුමන්ත්‍රණයක් ගැන ද, ඒ සඳහා උන් අප රට සතුරු ආක්‍රමණයෙන් මුදවා, ඒකීය සමෘධි මත් ශ්‍රී ලංකාවක් ගොඩනගන්නට ඒකාබද්ධව සිටි ශක්තිමත් දේශප්‍රේමී සම්බන්ධතාව තුළ උන් දුටු දුබලම පුරුක වන හිටපු යුදහමුදාපති වරයා ඉත්තෙකු ලෙස යොදාගෙන ඇති ආකාරය ද පෙන්වා දුනිමු.

"හැංගි හැංගි මුහුණු බැන්දත් නටන්න සිද්ධවෙන්නේ එළියේය" යන පැරණි සිංහල කියමන අකුරට ඔප්පු කරමින් මෙම දේශද්‍රෝහී තක්කඩි රැළ පසුගිය සති කීපය තුළ කළඑළියට පැමිණ ප්‍රසිද්ධියේ රැඟුම්පාන්නට පටන්ගෙන ඇත. මෙම ලිපියේ අරමුණ පිටරට සිට බලා නොව, ශ්‍රීලංකාවේ දැනට සිටින මට පෙනෙන ආකාරයට සිදුවීම් පාඨක ඔබට දැනවීමටත්, ඒ අතරම දේශප්‍රේමී ජනතාවට මෙම කූට උපක්‍රමය මගින් අනාගතයේ ඇති විය හැකි ව්‍යසනයද වළක්වා ලීමට වගකීමෙන් යුතුව ක්‍රියා කළ යුතු ආකාරය පෙන්වාදීමටත් ය.

## පොදු පුරුෂයා

ජනපතිවරණයට නාමයෝජනා බාර දීමට ආසන්න දින කීපයකට පෙර විවිධ ස්වරූපයෙන් යුත් එකිනෙකට නොගැලපෙන දේශපාලන හවුලක් නව ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණ යනුවෙන් අටවාගෙන ඔවුන්ගේ ජනපතිවරණයේ පොදු අපේක්ෂකයා වශයෙන් හිටපු ජෙනරාල් සරත් ෆොන්සේකා ඉදිරිපත් කෙරිණ. මෙම අපූරු හවුලේ එක්සත් ජාතික පක්ෂය, ජනතා විමුක්ති පෙරමුණ මංගල සමරවීර, මනෝ ගනේෂන්, රවුප් හකීම් යන අයත්, තවත් කලින් කිසිවෙකු නැසූ පිරිසක ගෙනුත් සමන්විතය. මොවුන් අත රින් ජනතා විමුක්ති පෙරමුණ හැර, අන් සියළු දෙනා යුද්ධය පැවති සමයේ කොටින්ට පක්ෂපාතීව කතා කළ අය වන අතර, යුද්ධය විහිළුවට ලක් කරමින් රණවිරුවන් සමච්චල යට හා අපහාසයට ලක්කරමින් සටන මොටකරන්නට කටයුතු කළ අතර, ශ්‍රීලංකා රජයට හා හමුදාවට එරෙහිව පියවර ගන්නා ලෙස පිටරටවලට, ඇමරිකාවට හා එක් සත් ජාතීන්ට බල කළ අය වෙති. යුද්ධය මෙහෙයවූ හමුදා ආඥාදායකයා ලෙස සරත් පොන්සේකාම එම තක්කඩි ද්‍රෝහීන්ට අද එක්වී සිටීම තරම් ලැජ්ජානැති කමක් ගැන අපට සිතන්නටවත් බැරිය.

## හංස පූට්ටුව

සරත් පොන්සේකාගේ ඡන්ද සළකුණ වන්නේ හංසයා ය. එය හංස පූට්ටුව යනුවෙන් නම් කළා නම් වඩාත් හොඳයයි සමහරුන් පළකරන මතයකි. අපේ සිංහල


පාඨක ඔබ සැමට 2010 සුබ නව වසරක් වේවා!




Photograph by Chathura S. Kodikara චතුර එස්. කොඩිකාර - Rivira - Sri Lanka

චිත්‍රශිල්පයේ හඳුන්වාදී ඇති ආකාරයේ හංස පූට්ටුවේ සිටින හංසයන් දෙදෙන ගෙළ පටලවා ගෙන සිටින දර්ශනය සුන්දර වුවත් ඔවුන්ට හෙල්ලෙන්නට බැරිව අකර්මණ්‍ය ස්වභාවයකට පත්ව සිටින බව ද ඉන් පෙන්නුම් කරයි. අද සරත් පොන්සේකා තවත් වල්මත්ව සිටින දේශපාලන කබල් සමග එක්වී අතරමංව ක්‍රියා විරහිතව අසරණව සිටින බව ද අපට පෙනේ. ඔහු මේ උත්සාහ ගන්නේ ද්‍රෝහීන් රොත්තක් වෙනුවෙන් රට විනාශකරන කටයුත්තක් එම ද්‍රෝහීන්ට ඉටුකර දෙන්නට බව පැහැදිලි ය.


4 වන පිටුව බලන්න →


වෙසේ ලොව පුරා නෑ යහළු මිත්තර
කෙසේ අමතමු ද ඒ සැවොම එක්වර
ලෙසේ හෙළ සිරිත් ගති නොයන අත්හැර
මෙසේ සුබ පතමු! අපි දෑත් එක්කර

Having lots of friends and relatives world over
It's difficult to greet alone each and everyone
Yet thinking about all of them and leaving none
We bring our palms together to say - 'Aubovan'!

♦ දයා ආනන්ද රණසිංහ ♦ *Daya Ananda Ranasinghe*




අපගේ හිතවත් ගණුදෙනුකාර භවතුන් සැමට
සාමය සතුට පිරි,
සුබ නව වසරක් වේවා!

FAST CASH
SEND TODAY - COLLECT TODAY


විස්තර
පිටු අංක
3